ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

# මාධ්‍ය නිවේදනය

මේ දිනවල පොලිස් නිලධාරීන් විසින් සිදුකරන අත්තනෝමතික ක්‍රියාත්මකවීම් නිසා ජනතාවගේ මානව හිමිකම් උල්ලංඝනයන් නිරන්තරයෙන්ම සහ දිගින් දිගටම සිදුවන තත්වයක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත. එම තත්වයන් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජීවගුණයට හා නීතියේ ආධිපත්‍යයට බලවත් තර්ජනයක් බව මානව හිමිකම් කොමිෂන් සභාවේ මතය වේ. නීතිය ආරක්ෂා කිරීමට බැඳී ඇති නිලධාරීන් මෙලෙස හැසිරීම කිසිසේත්ම අනුමත කළ නොහැක. මේ පිළිබඳව කරුණු විමසීම සඳහා 2022 නොවැම්බර් මස 21 වන දින පෙ.ව. 10.00 ට මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ පොලිස්පතිවරයාට කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයට පැමිණෙන ලෙස දන්වා යවා ඇත. මෙහිදී මෙවන් මානව හිමිකම් උල්ලංඝන තත්වයන් ඉදිරියේදී ඇති නොවීමට ගතහැකි පියවරයන් පිළිබඳ උක්ත පාර්ශයන් වෙතින් කරුණු විමසීම ද සිදුකරනු ලැබේ.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2022.11.14